---

**බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව**

**කළුතර දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය පකාශන 2012 මාර්තු 26 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ජනවාරි 16 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 **මතය**

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.151,492 ක් වටිනා පොත් වල හා රු.153,224 කට මිලදී ගෙන තිබූ වත්කම් විෂයයන් 05 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) රු.175,000 කට මිලදී ගෙන තිබූ රොටර් සේවින් යන්ත්‍රය ප්‍රාග්ධනිත කිරීමේදී රු.17,500 ක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට පොදු ගබඩා ගිණුමේ ශේෂය රු.1,284,547 කින් වැඩියෙන් දැක්විණි.

(ඈ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඉකුත් වර්ෂයේදී ලැබී තිබූ වරිපනම් බදු රු.53,472 ක් සමාලෝචිත වර්ෂයේ වරිපනම් ආදායමට ගැලපීම වෙනුවට සමුච්චිත අරමුදලට ගලපා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ආධාර වශයෙන් ලැබිය යුතු රු.44,316,613 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී හිඟ හිටි මුද්දර ආදායම වශයෙන් රු.41,416,205 ක් ලැබී තිබුණද සමාලෝචිත වර්ෂය ආරම්භයේ ලැබිය යුතු ශේෂය රු.15,349,794 ක් වීමෙන් ඉකුත් වර්ෂ වෙනුවෙන් වැඩියෙන් ලද රු.26,066,411 ක් සමුච්චිත අරමුදලට බැර කර නොතිබීම නිසා ප්‍රවර්තන වර්ෂයේ ලැබිය යුතු ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දැක්විණ.

(උ) ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පත් ගිණුමේ ශේෂය රු.528,436 ක් ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.68,441,245 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,755,603 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.20,594,382 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000' | රු.000' | රු.000' |
| (i.) වරිපනම් හා බදු | 6,861 | 8,435 | 2,091 |

| | | | | |
|---|---|---|---|---|
| (ii.) | බදු කුලී | 7,766 | 2,858 | 1,062 |
| (iii.) | බලපත්‍ර ගාස්තු | 1,046 | 861 | 69 |
| (iv.) | වෙනත් ආදායම් | 111,047 | 88,884 | 15,057 |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 10,432,491 |
| (ii) | මුද්දර ගාස්තු | 3,933,589 |

### 2.2.3 ව්‍යාපාර බදු

අධිකාරීපත්තුව උප කාර්යාලයේ 2011 වර්ෂයට අදාල රු.15,240 ක් වූ ව්‍යාපාර ස්ථාන 14 ක හිඟ ව්‍යාපාර බදු අදාල ව්‍යාපාර වසා දමා ඇති බවට හා රු.4,250 ක් වූ කර්මාන්ත 05 කට අදාල කර්මාන්ත බදු අදාල ව්‍යාපාර එම ස්ථානවලින් ඉවත් කර ඇති බවට 2012 ජනවාරි 18 දින අදායම් පරීක්ෂක ලබා දී ඇති නිර්දේශය මත කපා හැර තිබුණි. නමුත් 2011 වර්ෂයේ මෙම ව්‍යාපාර පවත්වා නොතිබූ බවට කිසිදු සාක්ෂියක් නොතිබුණි.

### 2.2.4 කඩ කාමරවලින් ජලය සඳහා ගාස්තු අය නොකිරීම

බණ්ඩාරගම වෙළඳ සංකීර්ණය තුළ කඩ කාමර 18 ක්ද, නව වෙළඳ සංකීර්ණය තුළ කඩ කාමර 15 ක් ද වශයෙන් කඩ කාමර බදු දී තිබූ අතර එකී ගිවිසුම් අනුව කඩ කාමරවලට අදාල ජල බිල්පත් බදුකරු විසින් ගෙවිය යුතුව තිබුණ ද සභාව යටතේ ඇති කිරිහල සඳහා වූ ජල ටැංකියෙන් කඩ කාමර සඳහා ජලය සපයා තිබුණි. මේ නිසා කිරි හලේ විදුලි බිල් ලෙස 2011 වර්ෂය සඳහා රු.73,525 ක්ද, 2012 සඳහා රු.97,577 ක්ද, 2013 ජනවාරි, පෙබරවාරි සඳහා රු.16,153 ක් ද සභාව වැයකර තිබුණි.

---

2.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) 2002 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එමින් තිබෙන රු.645,435 ක් වූ "අයකිරීමට තිබෙන වැඩ" ශේෂයද, 2009 ඔක්තෝබර් සිට ඉදිරියට ගෙන එමින් තිබෙන රු.10,470 ක් වූ "අගරු චෙක්පත්" ශේෂයද අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.111,752,661 ක් වූ වියදම් ණයහිමි ශේෂය තුළ රු.18,400,100 ක ශේෂ හඳුනා ගෙන නොතිබුණි.

2:4 **ආර්ථික නොවූ ගනුදෙනු**

චීනයේ නිෂ්පාදිත පීර් 250 මි.මී. ප්‍රමාණයේ ෂැම්බාවෝ වර්ගයේ අශ්වබල 20 පොදු විදුලි සැපයුමක් මගින් ක්‍රියාත්මක වන මෝටරයක් සහිත උපාංග ඇතුළත් කළුගල් ඇඹරීමේ යන්ත්‍රයක් සපයා සවිකිරීම සඳහා රු.1,834,875 ක් 2007 සැප්තැම්බර් 17 දිනද රැඳවුම් මුදලින් 50% ක් වූ රු.101,937 ක් 2008 මාර්තු 28 දිනද ගෙවා තිබුණි. 2008 ජූලි 01 දින යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමේදී එය නියමිත පරිදි ක්‍රියාත්මක නොවීම හේතුවෙන් සභාව විසින් රු.32,500 ක් වැය කර යන්ත්‍රය නැවත සකස් කොට එමගින් කළුගල් ඇඹරීමේ කාර්යය 2008 නොවැම්බර් මස ආරම්භ කර තිබුණි. මේ සඳහා මිල ගණන් කැඳවීමෙන් තොරව 2008 නොවැම්බර් 14 සිට 2009 නොවැම්බර් 16 දක්වා අඟල් 6x9 ප්‍රමාණයේ කළුගල් කියුබ් 644.94 ක් රු.1,133,690 ක් ගෙවා මිලදී ගෙන තිබුණි. ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂයකට ආසන්න කාලයක් පමණක් ක්‍රියාත්මක කර 2009 නොවැම්බර් සිට ව්‍යාපෘතිය අතරමග නතර කර තිබු අතර යන්ත්‍රය නිශ්ක්‍රීයව දිරාපත් වෙමින් පැවතුණි.

2.5 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනට නොපියවූ අත්තිකාරම් ශේෂය රු.4,037,971 ක් විය.

(ආ) නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ මාස 06 ඉක්මවූ රු.131,477 ක් වූ චෙක්පත් 23 ක් සම්බන්ධයෙන් විගණිත දිනය වූ 2013 අගෝස්තු 23 දින වන විටත් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396(ඇ) අනුව කටයුතු කර නොතිබුණි.

---

(ඈ) නිවෙස්වලට ජල නල එළීම සඳහා මාර්ගය පළුදු කිරීම වෙනුවෙන් 2010, 2011, 2012 වර්ෂවලදී රු.471,886 ක් සභාව විසින් අය කර තිබූ නමුත් එසේ පලුදු කර තිබූ මාර්ග පිළිසකර කිරීම හෝ යථා තත්ත්වයට පත්කිරීමට විගණිත දිනය වූ 2013 මාර්තු 06 දින වන විටත් පියවර ගෙන නොතිබුණි.

(ඈ) විවිධ වැඩබිම් වල ස්ථිර මාර්ග කම්කරුවන් 22 දෙදෙනෙකුද, ආදේශක මාර්ග කම්කරුවන් 26 දෙනෙකුද, ස්ථිර සෞඛ්‍ය කම්කරුවන් 7 දෙනෙකුද, ආදේශක කම්කරුවන් 16 දෙනෙකුද සේවයේ යොදවා තිබූ නමුත් රාජකාරිවල යෙදවීම පිළිබඳව රාජකාරි පැවරීම් සැලැස්මක් සකස් කර නොතිබූ අතර එදිනෙදා රාජකාරි පැවරීම පිළිබඳව ලිඛිත සටහන්ද පවත්වා නොතිබුණි.

(ඉ) සභාව වෙත ඉදිරිපත් කර තිබූ ඉදි කිරීම් සැළසුම් අයදුම්පත්වලින් 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වූ එකතුව 985 ක් වූ නේවාසික හා වාණිජ අයදුම්පත් සභාව විසින් අනුමත කර තිබූ නමුත් ඉදි කිරීම් අවසන් කර පදිංචි වීමට පෙර ලබා ගත යුතු අනුකූලතා සහතික එම අවුරුදු 4 සඳහාම ලබා ගෙන තිබුණේ 145 ක් පමණි.

(ඊ) ආයතනයේ දර්ශනය හා මෙහෙවර ඉටුකරගැනීම සඳහා වර්ෂ 3 කට නොඅඩු කාලයක් සඳහා වූ සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි.

(උ) වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ඌ) ආදායම් විෂයයන් 1 ක හා වියදම් විෂයයන් 4 ක 35% සිට 72% දක්වා පරාසයක් තුළ වාසිදායක විචලනයක් අනාවරණය වූ අතර ආදායම් විෂයයන් 2 ක හා එක් වියදම් විෂයයක 37% සිට 71% දක්වා පරාසයක් තුළ අවාසිදායක විචලනයක් අනාවරණය විය. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන තිබූ බවක් නිරීක්ෂණය නොවීය.

## 2.6 අභ්‍යන්තර විගණනය

ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) මූල්‍ය පාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) තොග පාලනය